# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2039/30 – 2017 ඔක්තෝම්බර් 06 වැනි සිකුරාදා – 2017.10.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, නාඋල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගඟල පල්ලෙසිය පත්තුව සුළු කොට්ඨාසයේ, ඇළගමුව (අ.භූ.පි. 18) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක Ma/NUL/2014/136 හා 2015.02.12 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත වූ ඉඩම් කැබැල්ලට මායිම් :

01. කැබලි අක්ෂර 'ඒ' – අඹන්ගඟදෙවෙලේ හේන්යාය – ප්‍රමාණය: හෙක්. 60.8474 ක් පමණ

උතුරට: අඹන් ගඟ; නැගෙනහිරට: රජය හිමිකම් කියන අඹන රජාවෙල රක්ෂිතය සහ මාර්ගය; දකුණට: රජය හිමිකම් කියන අඹන රජාවෙල රක්ෂිතය; බටහිරට: රජය හිමිකම් කියන අඹන රජාවෙල රක්ෂිතය සහ අඹන් ගඟ.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය : LD/05/1/2007/MV/117 J.
2017 අගෝස්තු 22 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

10-646



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම මෙයින් ප්‍රකාශ කරමි.

සබරගමු පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුරුවිට කෝරළේ උඩ පත්තු දකුණ සුළු කොට්ඨාසයේ, පැළෑදගම (අ.ග.පි. 423) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක R/RTN/2016/761 හා 2016.12.21 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් හෙක්. 4.8565 ක් වන කැබලි අක්ෂර 'ඒ' සහ 'බී' ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – පොතු ඇටතැන්නේ මූකලාන – ප්‍රමාණය: හෙක්. 4.3285**

උතුරට: හපුගස්තැන්න වැවිලි සමාගම හිමිකම් කියන පොතු ඇටතැන්නේ මූකලාන; නැගෙනහිරට සහ දකුණට: ප්‍රවේශ මාර්ගය; බටහිරට: ප්‍රවේශ මාර්ගය සහ හපුගස්තැන්න වැවිලි සමාගම හිමිකම් කියන පොතු ඇටතැන්නේ මූකලාන.

02. **කැබලි අක්ෂර 'බී' – පොතු ඇටතැන්නේ මූකලාන – ප්‍රමාණය: හෙක්. 0.5280**

උතුරට: ප්‍රවේශ මාර්ගය සහ හපුගස්තැන්න වැවිලි සමාගම හිමිකම් කියන පොතු ඇටතැන්නේ මූකලාන; නැගෙනහිරට: හපුගස්තැන්න වැවිලි සමාගම හිමිකම් කියන පොතු ඇටතැන්නේ මූකලාන; දකුණට: හපුගස්තැන්න වැවිලි සමාගම හිමිකම් කියන පොතු ඇටතැන්නේ මූකලාන සහ ප්‍රවේශ මාර්ගය; බටහිරට: ප්‍රවේශ මාර්ගය.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය : 4-3/15/2016/VE/256.
2017 ජුනි 21 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

10 – 647

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.